# රසායනික චිකිත්සාවෙහි අතුරු ආබාධ

**අතුරු අබාධ ඇති කරන්නේ කෙසේද?**
පිළිකා සෛල වැනි ඉක්මණින් වර්ධනයවන සෛලවලට රසායනික චිකිත්සාව මගින් බලපෑම් ඇතිකරයි. නමුත් ශරීරයෙහි ඇති වෙනත් සෛලද වේගයෙන් වර්ධනයවේ. මේවා ඇත්තේ ඇට මිදුළු (රුධිර සෛල වර්ධනය වන ස්ථානයේ), ආහාර මාර්ග පද්ධතිය (කට, ආමාශය සහ බඩවැල්). හිසකෙස් සහ ප්‍රජනන පද්ධතිය තුලය. අතුරු ආබාධ ඇතිවන්නේ රසායනික චිකිත්සා ප්‍රතිකාර මගින් මෙම සෞඛ්‍යයසම්පන්න සෛල හානිවූවිටය. සාමාන්‍ය වශයෙන් රසායනික චිකිත්සා මගින් ඇතිවන අතුරු ආබාධ සිදුවන්නේ දෙනු ලබන රසායනික චිකිත්සා ප්‍රමාණය සහ මාත්‍රාව අනුවය. ප්‍රතිකාරවලින් ඇතිවන බොහෝ අතුරු ආබාධ තාවකාලිකවේ.

**පිළිකා ප්‍රතිකාර මගින් ඇතිවන ප්‍රධානම අතුරු ආබාධ මොනවාද?**
රසායනික චිකිත්සාව මගින් ඇට මිදුළු තුල නිපදවෙන රුධිර සෛලවලට හානි පැමිණිය හැකිය. මේ මගින් රතු රුධිරාණු අඩුවීම (ඔක්සිජන් රැගෙන යන), රුධිර පට්ටිකා අඩුවීම (ලේ ගැලීම නවත්වන) සහ සුදු රුධිරාණු අඩුවීම (ආසාදනවලට එරෙහිව සටන් කරන) ඇතිවිය හැකිය. ඔබගේ වෛද්‍යවරයා විසින් ඔබගේ දරුවාට නිතිපතා රුධිර පරීක්ෂා නියම කරන අතර වරින් වර රුධිරය ලබාදීම නියම කල හැකිය. ඔබගේ දරුවා අසනීප වුවහොත් හෝ උෂ්ණත්වය 38සෙ හෝ ඊට වැඩිවුවහොත් **හැකි විගස** රෝහල සමග සම්බන්ධවීම වැදගත්වේ. වැඩිදුර විස්තර සඳහා ‘රුධිර පරීක්ෂා සහ රුධිර ගණන් ගැනීම’ විස්තර පත්‍රිකාව බලන්න.

ප්‍රතිකාර මගින් ආහාර මාර්ග පද්ධතියේ වණ සහ වේදනා ඇතිකරමින් සෛලවලට හානි ගෙනදිය හැකිය. සමහර විට වේදනාව කළමණාකරණය කිරීම සඳහා බෙහෙත් අවශ්‍යවිය හැකිය. හොඳ මුඛ සෞඛ්‍යය මගින් කටෙහි වණ මගින් ඇතිවන ආසාදන ඇතිවීමේ අවදානම අඩුකරගත හැකිවේ.

සමහර බෙහෙත් මගින් පාචනය ඇතිවිය හැකි අතර සමහරක් බෙහෙත් මගින් බඩ විරේකවීම සිදුවිය හැකිවේ.

ඔබගේ දරුවාගේ වැසිකිළි යාම සම්බන්ධ කිසියම් වෙනසක් ඇතොත් ඔබගේ හෙදිය හෝ වෛද්‍යවරයා සමග කථා කරන්න.

රසායනික චිකිත්සා හේතුවෙන් ඔක්කාරය සහ වමනය ඇතිවිය හැකිය. ඔක්කාරය සහ වමනයට ප්‍රතිකාර කිරීමට බෙහෙත් ලබාදේ. මෙම බෙහෙත් ඔබගේ නිවසේදී පාවිච්චියටද තබාගනු ඇත.

*පසුපිට හා සම්බන්ධවේ*

ප්‍රතිකාර හේතුවෙන් සියළුම ළමුන්ගේ වාගේ හිසකෙස් හැලේ. නැතිවයන හිසකෙස් ප්‍රමාණය ප්‍රතිකාරයේ ආකාරය අනුව වෙනස්වේ. හිසකෙස් හැලීම සාමාන්‍යයෙන් ආරම්භවන්නේ රසායනික චිකිත්සාවෙන් සති දෙකේ සිට තුන අතර කාලයකදීය. සියළු කෙස් එක් රැයකින් නැතිවීයා හැකි අතර සමහර විට ඒ සඳහා සති කිහිපයක් ගතවිය හැකිය. හිසකෙස් යාම බොහෝදුරට හිසකෙස් හැලීම සිට තට්ටය ඇතිවීම දක්වා විය හැකිය. කෙස් හැලීම ශරීරයේ, ඇහි පිහාටු සහ ඇහි බැම් ආදී ස්ථානවලද විය හැකිය. හිසකෙස් සැමවිටම නැවත වැවෙන අතර පෙනීම වෙනස් විය හැකිය.

## මට වැඩිදුර විස්තර ලබාගත හැක්කේ කොහින්ද?

ඔබගේ දරුවාට ලබාදෙන ප්‍රතිකාරවල විශේෂ අතුරු ආබාධ ඔබගේ වෛද්‍යවරයා සහ හෙදිය විසින් ඔබට පැහැදිලි කර දෙනු ඇත. ඔබගේ මුල් භාෂාව ඉංග්‍රීසි නොවේනම්, මෙම හමුවීම්වලදී උපකාර ලබා ගැනීමට භාෂා පරිවර්තකයෙකු ලබා ගන්න. විශේෂිත බෙහෙත් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා ඔබගේ oncology ඖෂධවේදියා හොඳ පුද්ගලයෙකි. මෝඩ ප්‍රශ්නයක් යනුවෙන් කිසිවක් නොමැතිබව හොඳින් මතක තබා ගන්න.

**වගකීමෙන් බැහැරවීම:** අධ්‍යාපනය සහ තොරතුරු සඳහා පමණි. ප්‍රකාශනය පලකරන අවස්ථාවේ මෙහි අඩංගුදේ නිවැරදිවේ. කෙසේවුවද, කාලයක් පුරා තොරතුරු වෙනස්විය හැකිය. ඔබගේ වෛද්‍ය ප්‍රශ්න සඳහා සැමවිටම ඔබගේ සෞඛ්‍යය රැකවරණ කණ්ඩායමෙන් උපදෙස් ලබාගන්න.

සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම The Royal Children's Hospital, Monash Children's – Southern Health and The Peter MacCallum Cancer Centre හි Paediatric Integrated Cancer Service for the Children's Cancer Centre මගිනි. **2011 සැප්තැම්බර්**

Paediatric Integrated Cancer Service
A statewide cancer service for children